ගරු ස්වාමීන්වහන්ස
ප්‍රිය මහත්මයාණෙනි/ මහත්මියනි/ මෙනෙවියනි

<u>**47 වැනි උපාධි ප්‍රදානෝත්සවය**</u>

47 වැනි උපාධි ප්‍රදානෝත්සවයට සහභාගිවන ලෙස දන්වමින් උපාධිලාභීන් වෙත යවන ලද 2022.02.08 දිනැති ලිපිය සහ ඒ සම්බන්ධයෙන් 2022.02.11 දින විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවියේ පළ කරන ලද දැන්වීම හා බැඳේ.

එම ලිපියෙහි හා දැන්වීමෙහි අවසන් පිටුවේ **සැලකිය යුතුය** යනුවෙන් සඳහන් උපදෙස් යටතේ ශාලාවට ඇතුළු වීමේදී COVID 19 එන්නත් මාත්‍රා දෙක සහ ප්‍රතිශක්ති වර්ධක එන්නත් මාත්‍රාව (Booster dose) ලබාගෙන තිබීම අවශ්‍ය බව සඳහන් කරන ලද්දේ අද රට තුල පවතින COVID 19 වසංගත රෝගයට ගොදුරු වීමේ අවධානමෙන් සියළුදෙනාම ආරක්ෂාකර ගැනීමට සහ ඔවුන් ඒ සඳහා පෙළඹවීමේ යහපත් චේතනාවෙන් උපාධි ප්‍රදානෝත්සව කමිටුව විසින් ගත් තීරණයකට අනුවයි.

එහෙත් බොහෝ උපාධිලාභීන් මේ වන විටත් තුන්වන මාත්‍රාව ලබාගෙන නොමැති බැව් අපවෙත දන්වා ඇති බැවින් එම තීරණය පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලද බව කාරුණිකව දන්වමි.

**"ශාලාවට ඇතුලුවීමේ දී COVID 19 එන්නත් මාත්‍රා දෙක ලබාගත් බව සඳහන් කාඩ් පත හෝ දින තුනක් ඇතුලත ලබාගත් ප්‍රතිදේහජනක පරීක්ෂණ වාර්තාවක් (Rapid Antigen Test) ඉදිරිපත් කළ යුතුය"**

තවද එම උපාධි ප්‍රදානෝත්සවයේ නවවන සැසියට අදාළව තාක්ෂණ පීඨයෙන් පිරිනමනු ලබන උපාධි කිහිපයක "ගෞරව උපාධිය" යන්න සඳහන් වී නොමැත. එය පහත සඳහන් පරිදි නිවැරදි කර ඇත.

නවවන සැසිය - **2022 පෙබරවාරි මස 28 වැනි දින පෙ.ව. 10.30 සිට ප.ව. 01.00 දක්වා තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදී ගෞරව උපාධිය, ජෛව පද්ධති තාක්ෂණවේදී ගෞරව උපාධිය, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණවේදී ගෞරව උපාධිය යන උපාධිවලට අදාළ සියලුම උපාධිලාභීන් සඳහා**

ජී. පියරත්න
පරිපාලන සම්බන්ධීකාරක
අධ්‍යයන, ශිෂ්‍ය කටයුතු, විභාග හා ප්‍රකාශන අංශය